## දේශපාලන විද්‍යාව

**පරීක්ෂණ පරිපාටිය :—**

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණයට විෂයයක් වශයෙන් පැවැත්වෙන දේශපාලන විද්‍යා පරීක්ෂණයට පහත දැක්වෙන අන්දමට පැය තුනේ ප්‍රශ්න පත්‍ර තුනක් ඇතුළත් වේ.

දේශපාලන විද්‍යාව I (දේවිසා 1): දේශපාලන සහ සමාජ න්‍යාය.
දේශපාලන විද්‍යාව II (දේවිසා 2): ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රමය.
දේශපාලන විද්‍යාව III (දේවිසා 3): රාජ්‍ය පරිපාලන.

**දේශපාලන විද්‍යාව I (දේවිසා 1): දේශපාලන සහ සමාජ න්‍යාය**

1. දේශපාලන චින්තනයේ ප්‍රධාන දහරාවන් පිළිබඳ දළ සමීක්ෂණයක්:
   i. පැරණි ඉන්දීය – කෞටිල්‍යා, රාජ්‍යයයේ ස්වභාවය පිළිබඳ බෞද්ධ මතය.
   ii. ග්‍රීක – ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්.
   iii. රෝම – සියරෝ.
   iv. මධ්‍යකාලීන–සාන්ත ඔගස්ටින් සහ සාන්ත ඇක්වයිනාස්.

2. නූතන රාජ්‍යය පිළිබඳ න්‍යායයන්.
   දේවවරම්වාදය, මැකියාවෙලි, සමාජසම්මුතිවාදය. විඥණාවාදී න්‍යාය, මාක්ස්වාදී න්‍යාය, සමාජ විද්‍යාත්මක න්‍යාය, ස්වාධිපත්‍යය සහ නීතියේ ස්වභාවය.

3. ලිබරල්වාදය ධනේශ්වරවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය.

4. සමාජවාදය –
   — මාක්ස්ට පෙර සමාජවාදය, මනඃකල්පිත සමාජවාදය.
   — මාක්ස්වාදී සමාජවාදය, මාක්ස්වාදය සහ එහි වර්ධනයන්. ලෙනින් සහ මා ඕ සේතුං
   — අනධිකාරිවාදය, සම්මේලනවාදය, ශ්‍රේණි සමාජවාදය, සංශෝධනවාදය (බර්න්ස්ටයින්) සහ නූතන සංශෝධනවාදය, පෙබියන්වාදය.

5. ෆැසිස්ට්වාදය

6. වැදගත් දේශපාලන සහ සමාජ සංකල්පයන් කිහිපයක් –
   නිදහස, සමානාත්මතාවය, දේපොළ, අයිතිවාසිකම් සහ යුතුකම්.

7. ජාතිකවාදය සහ අන්තර්ජාතික ක්‍රමය.

**දේශපාලන විද්‍යාව II (දේවිසා 2) : ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රමය.**

බ්‍රිතාන්‍ය යුගයේ ආරම්භයේ සිට ලංකා දේශපාලන ක්‍රමයේ විකාශනය

— ජාතිවාදී ව්‍යාපාරයේ වර්ධනය.
— ව්‍යවස්ථා වර්ධනය.
— ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව – එහි පසුබිම, එහි ප්‍රධාන ලක්ෂණයන් සහ එහි ක්‍රියාකාරිත්වය.
— නියෝජන ක්‍රමය සහ ඡන්ද බලය.
— දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම් සහ වාර්ගික සංවිධාන.
— බහුජන මාධ්‍ය සහ දේශපාලන ක්‍රියාවලිය.
— ලංකාවේ සමාජීය, ආර්ථික සහ ආගමික ප්‍රශ්න සහ දේශපාලන ක්‍රියාවලිය කෙරෙහි ඒවායේ බලපෑම්.

**දේශපාලන විද්‍යාව III (දේවිසා 3): රාජ්‍ය පරිපාලනය**

1. රාජ්‍ය පරිපාලනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? විවිධ අදහස් හා මත සාකච්ඡා කිරීම. රාජ්‍ය පරිපාලනයේ දේශපාලනික, සමාජීය හා ව්‍යවස්ථානුකූල පසුබිම.

2. බ්‍රිතාන්‍යයේ, ප්‍රංශයේ, ලංකාවේ සහ ඉන්දියාවේ ඇති මධ්‍ය පරිපාලනය සහ විමධ්‍යගත පරිපාලන ක්‍රම. මීට ඇතුලත් විය යුතු මාතෘකා නම් :—

මධ්‍ය ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සංවිධානය හා ඒවාට කාර්යයන් වෙන් කර බාරදීම;

ප්‍රංශයේ ප්‍රිෆෙක්ට් (Prefect) ක්‍රමය, ඉන්දියාවේ පන්චයාට් රාජ් ක්‍රමය සහ ලංකාවේ කච්චේරි ක්‍රමය ගැන වැඩි අවධානයක් යොමු කරමින් විමධ්‍යගත කිරීම;

විවිධ පළාත් පාලන ක්‍රම සහ පළාත් පාලන ව්‍යූහය; බ්‍රිතාන්‍යයේ ෆුල්ටන් (Fulton) වාර්තාව ඇතුළු රාජ්‍ය සේවය.

3. සංවර්ධනය වන්නාවූ රටවල විශේෂ ගැටළු ගැන විශේෂ අවධානය යොමු කරමින් සංවර්ධන පරිපාලනය පිළිබඳ සංකල්ප හා ප්‍රශ්න.

උපදේශිත කියවීම් :—

දේශපාලන විද්‍යාව I

JEFFRIES — *Ceylon—The Path to Independence*
SIR IVOR JENNINGS — *The Constitution of Ceylon*
G. C. MENDIS — *Ceylon under the British*

LENNOX A. MILLS — *Ceylon Under British Rule* 1795—1932

S. NAMASIVAYAM — *The Legislatures of Ceylon*. 1928—1948

M. HENRY OLIVER (Jr.) — *Economic Opinion and Policy in Ceylon*

I. D. S. WEERA-WARDENA — *Government and Politics in Ceylon* 1931—1946.

I. D. S. WEERA-WARDENA — *Ceylon General Election*, 1956.

HOWARD W. WRIGGINS — *Ceylon : Dilemmas of a New Nation*

දේශපාලන විද්‍යාව II

SIR IVOR JENNINGS — Additional Notes on the General Elections, *Ceylon Historical Journal*, II, Nos. 3 & 4 (January and April 1953), 193—208.

SIR IVOR JENNINGS — "Nationalism and Political Development in Ceylon" *Ceylon Historical Journal*, III, Nos. 1—4 (July—October 1953) 62—84, 99—114, 197—206.

SIR IVOR JENNINGS — "The Ceylon General Elections of 1947" *University of Ceylon Review*, VI, No. 3 (July 1948), 133—195.

I. D. S. WEERA-WARDANA — "General Elections in Ceylon 1952" *The Ceylon Historical Journal*, II, Nos. 1 & 2 (July—October 1952). 111—178.

A. J. WILSON — "*The Crewe-Mc Callum Reforms*" (1912—1921). *The Indian Journal of Historical* ... *and Social Studies*, Vol. I, No. I January 1958.

A. J. WILSON — "The Finance Committee under the Manning Constitution of 1924" *University of Ceylon Review*, Vol. 18, Nos. 3 & 4, (July—October 1960).

A. J. WILSON — "Public Administration of Ceylon, 1796—1961" *Public Administration in South and south-east Asia*, ed. S. S. Hsueh 1962, The International Institute of Administrative Science, Brussels.

L. D. WHITE — *Introduction to Public Administration*
E. N. GLADDEN — *The Essentials of Public Administration*
W. J. M. MACKENZIE AND J. W. GROVE — *Central Administration in Britain*
F. F. RIDLEY AND J. BLONDEL — *Public Administration in France*
H. MADDICK — *Democracy, Decentralisation and Development*
H. MADDICK — *Panchayati Raj*
B. CHAPMAN — *The profession of Government*
R. BRAIBANTI (ed) — *Asian bureaucratic systems*
A. H. HANSON & M. WALLAS — *Governing Britain*
— *Report of the Fulton Committee on the Civil Service* Cmnd. 3638 (1968)
H. R. G. GREAVES — *The Civil Service in the changing state*
A. H. HANSON & J. DOUGLAS — *Indian democracy*
B. CHAPMAN — *Introduction to French local government*
J. A. L. COORAY — *Constitutional and Administration Law*
V. KANESLINGAM — 100 *years of local government in Ceylon*
WISWA WARNAPLA W. A. — *Civil Service Administration in Ceylon* Community No. 3, 1963.
A. J. WILSON — *The Public Service in Ceylon*
— *Journal of Administration Overseas Jan.* 1976.
G. R. T. LEITAN — *The role of the Government Agent in Sri Lanka.*